**සීතාවක ප්‍රාදේශීය සභාව**
**කොළඹ දිස්ත්‍රික්කය**
**-------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 22 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 17 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන 2016 දෙසැම්බර් 31 දිනට සීතාවක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) රු.900,000 ක් වූ කොම්පොස්ට් බඳුන් 250 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) රු.18,552,063 ක ස්ථාවර වත්කම්, ප්‍රාග්ධන වියදම් ගිණුමෙහි රු.18,942,763 ක් ලෙස ගිණුම් ගත කිරීම නිසා ප්‍රාග්ධන වියදම රු.390,700 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2014 වර්ෂයේ උසාවි දඩ වෙන් කිරීම තුල රු.10,647,063 ක අඩුවෙන් කිරීමක් තිබියදී, මූල්‍ය ප්‍රකාශනවල 2014 වර්ෂය සඳහා ලැබිය යුතු උසාවි දඩ මුදල රු.16,000,000 ක් වන පරිදි ගැලපීම නිසා උසාවි දඩ ගිණුම රු.5,352,937 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) හිඟහිටි එකතු කල අගය මත බදු ශේෂය වූ රු.63,123 ක් ගිණුමෙන් ඉවත් කිරීමේදි සමුච්චිත අරමුදලට ගැලපීම හේතුවෙන් එම ගිණුම රු.63,123 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) හංවැල්ල උපකාර්යාලයේ ගලි බවුසරයෙන් 2016 වර්ෂයේ උපයාගෙන තිබුණු රු.986,296 ක් වර්ෂයේ ආදායමට ගෙන නොතිබුණි.

(ඊ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යැවිය යුතු බදු වටිනාකම වූ රු. 120,868 ක් තැන්පත් ගිණුමට බැර කිරීම හේතුවෙන් ගෙවිය යුතු බදු ගිණුම රු.120,868 කින් අඩුවෙන් හා පොදු තැන්පත් ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) 2016 වර්ෂයට අදාලව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු රු.64,546 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) 2016 වර්ෂයේ අවසාන දිනට පොදු ගබඩා ගිණුමේ ශේෂය රු.490,819 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සභාව විසින් 2009 සිට 2011 දක්වා කාලය තුල එකතු කල රු.185,251 ක බදු මුදල් දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා නොතිබුණි.

(ඒ) 2016 දෙසැම්බර් මාසය සඳහා දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු එකතු කල අගය මත බදු මුදල රු.565,545 ක් විවිධ තැන්පතු ගිණුමට රු.4,015,003 ක් ලෙස බැර කිරීම හේතුවෙන් විවිධ තැන්පත් ගිණුම රු.3,449,458 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

-----------------------------

ගිණුම් විෂයන් 2 ක අවසන් ගිණුම් අනුව ශේෂ හා ඒවාට අදාල උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු.7,849,089 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.6,113,839 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,247,988 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.33,896,818 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව සභාව විසින් ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2016 | | | | 2015 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | **2016 ජනවාරි 1 දිනට හිඟ ශේෂය** | **බිල් කිරීම** | තථ්‍ය අයකර ගැනීම | **2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය** | **2015 ජනවාරි 01 දිනට හිඟ ශේෂය** | **වර්ෂයේ බිල් කිරීම්** | තථ්‍ය අයකර ගැනීම | **2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 5,891,802 | 19,130,653 | 17,099,198 | 7,923,257 | 6,533,272 | 10,239,591 | 10,881,061 | 5,891,802 |
| බලපත්‍ර ගාස්තු | - | 1,663,045 | 1,663,045 | - | - | 1,483,777 | 1,483,777 | - |
| වෙළඳ ස්ථාන කුලී | 955,464 | 4,135,012 | 4,649,656 | 440,820 | 548,632 | 4,496,449 | 4,089,617 | 955,464 |
| කර්මාන්ත හා ව්‍යාපාර බදු | - | 2,629,070 | 2,629,070 | - | - | 2,212,330 | 2,212,330 | - |
| මස් කඩ | 311,817 | 6,261,468 | 6,262,710 | 310,575 | 319,375 | 8,859,850 | 8,867,407 | 311,817 |

### 2.2.2 වරිපනම්

සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් රු.7,923,257 ක් වූ අතර එයින් රු.1,931,825 ක් පෙර වර්ෂ වලට අදාල හිඟ වරිපනම් විය.

### 2.2.3 වෙළඳ ස්ථාන කුලී

හංවැල්ල වසා දමා ඇති වෙළඳ ස්ථානයකින් අයවිය යුතු රු.50,297 ක හිඟ කුලී අයවීම සම්බන්ධයෙන් අවදානමක් පැවතුනි.

### 2.2.4 මස්කඩ කුලී

2015 හා ඊට පෙර වර්ෂ වලට අදාල හිඟ කුලී වටිනාකමින් ප්‍රවර්තන වර්ෂයේදී අයකර ගෙන තිබුනේ රු.126,379 ක් වූ අතර එම අයකර ගැනිම මුළු හිඟ කුලී ආදායමින් සියයට 41 ක ප්‍රමාණයක් විය. පෙර වර්ෂ වෙනුවෙන් වූ හිඟ කුලී, වටිනාකමින් සියයට 59 ක් එනම් රු.185,438 ක් අයකර ගැනීම සඳහා සභාව විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
---------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පාදුක්ක සතිපොළ නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීම.
------------------------------------------------------------------------

පාදුක්ක සතිපොළ සංවර්ධනය කිරීම සඳහා 2014 මැයි 24 දින නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගෙන සභාව වෙත භාර නොදී ආදායම් එක්රැස් කරමින් පැවතුණි. නමුත් සතිපොළ පිරිසිදු කිරීම සඳහා ප්‍රවර්ථන වර්ෂය වෙනුවෙන් සභාව විසින් රු.3,354,452 ක මුදලක් වැයකර තිබුනු නමුත් එම මුදල නාගරික සංවර්ධන අධිකාරියෙන් ප්‍රතිපූර්ණ කරගෙන නොතිබුණි.

(ආ) දේපළ තහනම් කිරීමේ නිලධාරින් සඳහා කොමිස් මුදල් ගෙවීම
-------------------------------------------------------------------

2016 මාර්තු 24 දින පැවති පරිපාලන ව්‍යුහාත්මක හා ටෙන්ඩර් කමිටු වාර්තාවේ 4 වන තීරණයට අනුව දේපළ තහනම් කිරීමේ නිලධාරින් විසින් එකතු කරන මුදල් දිනපතාම කාර්යාලයේ තැන්පත් කළ යුතු වුවද, එය ප්‍රමාද කළ අවස්ථා වලදී කොමිස් මුදල් නොගෙවා සිටීමට තීරණය කර තිබුණ ද එම තීරණයට පටහැනිව 2016 මුල් මාස 05 ට අදාලව රු.14,429ක් ගෙවා තිබුණි.

3.2 නිශ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්
-----------------------------------------

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2015 වර්ෂයේදී රු.13,710,140 ක වියදමක් දරා ඉදිකර තිබු සුදුවැල්ල ආදාහනාගාරය සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් විවෘත කර නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය
----------------------------

2016 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 31 ක වැඩ අවසන් කර නොතිබු අතර එහි ඇස්තමේන්තු පිරිවැය රු.23,619,453 ක් විය.

3.5 කසල කළමනාකරණය

---------------------------

2016 වර්ෂයේදී කසල කළමනාකරණය වෙනුවෙන් සේවක වියදම් හා වාහන නඩත්තු ලෙස රු.3,374,830 ක් වැය කර තිබූ අතර කොම්පෝස්ට් විකිණීමේ ආදායම හා නොදිරන කසල අලෙවියෙන් රු.595,984 ක ආදායමක් උපයාගෙන තිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

-------------------------------------

4.1 අයවැය පාලනය

-----------------

අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූ අතර අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

-----------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පාලනය

(ඇ) අභ්‍යන්තර විගණනය